270

# මහජන බැංකු ශාඛා ව්‍යාප්තිය ග්‍රාමීය අංශය මූල්‍යකරණය වීම කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

එච්. ජ්. ලොකු බණ්ඩා

ලියා පදිංචි අංකය: ECON / R/ 95 / 98

කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යා පීඨයේ
ආර්ථික විද්‍යාව පිළිබඳ සාමාජීය විද්‍යාපති පශ්චාත් පර්යේෂණ උපාධිය
සඳහා ඉදිරිපත් කරන ලදී

2001

ආර්ථික විද්‍යා අධ්‍යනාංශය
කැලණිය විශ්ව විද්‍යාලය
කැලණිය

ප්‍රවේශ අංකය 270
වර්ග අංකය

## නිබන්ධ සාරාංශය

"මහජන බැංකු ශාඛා ව්‍යාප්තිය ග්‍රාමීය අංශය මූල්‍යකරණය වීම කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අධ්‍යයනයක්" යන මැයෙන් මෙකී නිබන්ධය සකස්වී ඇත. මෙහි පර්යේෂණ ගැටළුව වන්නේ අසංවිධිත මූල්‍ය වෙළඳපොල කටයුතු සංවිධිත කිරීමෙහි ලා වැදගත් පියවරක් වශයෙන් මහජන බැංකුව සිය ශාඛා ව්‍යාප්තිය සිදුකර තිබීම හා ඒ තුලින් ග්‍රාමීය අංශය මූල්‍යකරණය කොතෙක් දුරට ඉටුවී තිබේද යන්න විමසුමට යොමු කිරීමයි. විස්තරාත්මකව කෙරෙන මෙම අධ්‍යයනය සඳහා ඉදිරිපත් වූ උපන්‍යාසය වූයේ ආර්ථික සමාජ විචල්‍යයන් හා බැංකු ක්‍රමය ජන සමාජයේ අඩු ආදායම් ලාභීන් දක්වා ව්‍යාප්තිය හා පහසුකම් ප්‍රශස්ත ලෙස තවදුරටත් ක්‍රියාත්මක වී නොමැති බවයි. මෙහිදී මූලික අරමුණට අමතරව තවත් විශේෂිත අරමුණු කිහිපයක්ම විමසුමට ලක්විය. අධ්‍යයනයේ පසුබිම, අධ්‍යයනයේ වැදගත්කම, ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොල සංකල්ප සැකෙවින් හඳුනාගැනීම හා මූල්‍ය වෙළඳපොල ඓතිහාසික විකාශනය ඒ අතර වේ. ඉන් අනතුරුව සසම්භාවී ලෙස තෝරාගත් අධ්‍යයන ප්‍රදේශ හා දත්ත විශ්ලේෂණයද දැක්වෙන අතර, අධ්‍යයනයේ ප්‍රතිඵලද, අවසාන වශයෙන් බැසගත් නිගමන හා ප්‍රතිපත්තිමය යෝජනාවන්ද දැක්වේ.

භාවිත ක්‍රමවේදය අනුව, සසම්භාවී ලෙස ලංකාවේ කොළඹ,බදුල්ල,හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක තෝරා ගන්නා ලදී. මෙයින්ද ප්‍රදේශ තෝරා ගැනීමේදී නාගරික (බොරැල්ල, වනාතමුල්ල, ටී 20 වත්ත), වතුකර (වැලිමඩ, උඩුම්ල්ලාගම), ග්‍රාමීය (කන්තලේ ,වාන්ඇල ගොවිජනපදය) කම්කරුවන් ඇතුලත් වන ආකාරයේ බහුපියවර නියැදීමේ ක්‍රමයක් අනුගමනය කරන ලදී. ප්‍රදේශ තුනෙහිම පවුල් සංඛ්‍යාව 875 ක් වූ අතර ඉන් පවුල් 150 ක් ප්‍රශ්නාවලියක් පාදක කොටගත් නියැදි සමීක්ෂණයකට භාජනය කරන ලදී. එම පවුල් සංඛ්‍යාව සංගහනයෙන් 15% කට වැඩි ප්‍රමාණයක් නියෝජනය විය. ප්‍රාථමික දත්ත වලට අමතරව ද්විතීයක දත්ත ප්‍රයෝජනයට ගන්නා ලදී. අවශ්‍ය සහභාගීත්ව නිරීක්ෂණය අධ්‍යයන කාලසීමාව තුල ප්‍රදේශ තුනෙහිම ක්‍රියාත්මක විය. ඒ හැර කලක් මා ප්‍රදේශයේ ජීවත්වීමෙන් ලැබූ අත්දැකීම් (කන්තලේ) හා බැංකු නියෝජ්‍ය කළමණාකරුවෙකු වශයෙන් සේවය කිරීමෙන් ලැබූ අත්දැකීම් (බොරැල්ල) ද ඉවහල් විය.

ලබාගත් පොදු ප්‍රතිඵල හා නිගමන සැකෙවින් පහත සඳහන් පරිදි දැක්විය හැක. නූගත්කම, දරිද්‍රතාවය හා දිළිඳුකම යන සාධක ජන සමාජයේ අඩු ආදායම් ලාභීන් බැංකු ක්‍රමයෙන් ඈත්කර තැබීමට තවදුරටත් හේතුවී ඇත. අඩු ආදායම් ලාභීන්ගේ ක්ෂණික මූල්‍ය අවශ්‍යතා තවමත් පිරිමසාලනු ලබන්නේ අසංවිධිත මූලාශ්‍ර මගින් බව පැහැදිලි වේ. සුරැකුම් විරහිත ක්ෂණික ණය සැපයීමේ අපහසුකම් සංවිධිත අංශයේ තවමත් සම්බාධකයක්ව පවතින බව පෙනී ගිය කරුණකි. ග්‍රාමීය අංශයේ ජනයා ස්වකීය ණය අවශ්‍යතාවයන් සඳහා සාම්ප්‍රදායික වශයෙන් වුවත් රැඳී සිටියේ අසංවිධිත මූලාශ්‍රයන් කෙරෙහිය. සාම්ප්‍රදායික ග්‍රාමීය ජන සමාජයේ ලක්ෂණයක් වන අනුග්‍රාහක ගණුදෙනුකාර සම්බන්ධතාවල එක් පැත්තක් වශයෙන් එය හඳුනාගැනීමට සිදුවේ.

නාගරික , වතුකර, ග්‍රාමීය අඩු ආදායම් ලාභී කම්කරු පවුල් අතර ඉහළ ආදායම් ඉල්ලුම් නම්‍යතාවයක් පැවතීම නිසා ඉතුරුම් අවම වීමට හේතුවී ඇත. ආදායම ශූන්‍ය වුවත් පාරිභෝජනය සිදුවන බැවින් පාරිභෝජනය පවත්වාගෙන යාමට වුවද, ණයගැනීමට සිදුවන නිසා ණයගැතිභාවය තවදුරටත් වර්ධනය වීමට හේතුවී ඇත. මහජන බැංකුව ඇතුළු බැංකු, ඉතුරුම් සංචලන ප්‍රවර්ධන වැඩ පිළිවෙලවල් නිසා ආන්තික ඉතුරුම් රාශිකරණය අඩු ආදායම් ලාභීන් අතර, අවම වීමට හේතුවී ඇත. අඩු ආදායම් ලාභීන් හදිසි මුදල් අවශ්‍යතා සපුරාගැනීම සිදුවන ආකාරයට අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව සමීක්ෂිත ප්‍රදේශ තුනෙහිම 79.4% (ආසන්න වශයෙන් 80%) ක් පමණ, අසංවිධිත මූලාශ්‍ර කරා යොමුවී ඇත. මෙම අසංවිධිත මූලාශ්‍ර අතර දෙමාපිය සහෝදර

සහෝදරියන්, අසල්වාසීන්, ඥාති හිතමිත්‍රාදීන් වැඩි පොලියට ණය දෙන්නන් හා ග්‍රාමීය සුළු වෙළඳසැල් හිමියන්ද වැදගත් වේ. ණය පිළිබඳ දැක්වීමේදී ගම්‍යමාන කරුණක් වන්නේ සංවිධිත ණය විධිමත්ය, අසංවිධිත ණය අවිධිමත්ය යන්නයි. සංවිධිත අංශය අඩු පොලී අනුපාතික අයකරන අතර, අසංවිධිත ණය දෙන්නන් ඉහළ පොලී අනුපාතික අයකරන්නේය යන මතයයි. මෙවැනි මතයක් අවශ්‍යයෙන්ම අඩු ආදායම් ලාභීන්ගේ හැඟීමද නොවේ. සමහර විට ඔවුනට අසංවිධිත ණයදීමේ නම්‍යතාව වඩා වැදගත් වේ. මහජන බැංකුව හා එයට අයත් ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය තුළද බොහෝදුරට එහි ප්‍රතිලාභ හිමිකරගෙන ඇත්තේ මධ්‍යම ප්‍රමාණයේ ආදායම් උපයන කිසියම් ස්තරයක් මිසක අඩු ආදායම් ලබන පුද්ගලයන් නොවන බව පෙන්නුම් කරයි. දිවයිනේ අසංවිධිත මුදල් වෙළඳපොල ක්‍රියාත්මක වන්නේ බැංකු ශාඛා පද්ධතියක් ඇති නිසා මිස, නැති නිසාම නොවන බවද, පෙනීගිය කරුණකි.

මේ සඳහා ඉදිරිපත් කරන යෝජනා අතර, සාම්ප්‍රදායික සුරැකුම් වෙනුවට සාමූහික ඇප පදනම් කරගත් කණ්ඩායම් ණය ක්‍රම දියත් කල යුතු වේ. ඉතුරුම් සංචලනය හා අරපිරිමැසුම් වැඩ පිළිවෙලට කාන්තා සහභාගීත්වය තවදුරටත් වර්ධනය කිරීම අවශ්‍ය වෙයි. බැංකු පුරුදු ඇතිකිරීමෙහි ලා පාසල් විෂයයක් වශයෙන් පාසල් විෂයය ධාරාවට "බැංකු පුරුදු" ඇතුලත් කල යුතු වේ. ඒ හැර පසු විපරම්, සමාජ සජීවකරණ හා විපර්යකාරක වැඩ මුළු තවදුරටත් ව්‍යාප්ත කිරීම කළ යුතුව ඇති බව පෙන්නුම් කර ඇත.